

ඡායාරූපය - සංජීව් ද සිල්වා

# දේශගුණික වෙනස්වීම් වල බලපෑමෙන් ස්වාභාවික සම්පත් සහ ජෛව විවිධත්වය සුරැකීම

අපි අපගේ සියළු ද්‍රව්‍යමය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සොබාදහම සහ එහි පරිසර පද්ධති මත යැපෙමු. එනම් ගෘහස්ථ, කර්මාන්ත සහ ජල විදුලි උත්පාදනය සඳහා අවශ්‍ය ජලය; බෝග වගාව සහ පශු සම්පත් පාලනය; ධීවර; වනාන්තර; සංචාරක සහ විනෝදාස්වාදය; සහ පාරම්පරික ඖෂධ වේ.  තවමත් අපගේ ආර්ථික නිපැයුම් සහ අපනයන වලදී වැඩි දායකත්වය ලැබෙන්නේ ස්වාභාවික නිෂ්පාදන මගිනි.

ශ්‍රී ලංකාවේ පවතින ඉහළ ජෛව විවිධත්වයට, විවිධ පාරිසරික පද්ධති, විවිධ ශාක සහ සත්ව විශේෂ ඇතුලත්වන අතර පුළුල් පරාසයක පැතිර පවතින පාරිසරික ප්‍රතිලාභයන්ද අපට සපයයි. පසෙහි සරු බව නඩත්තු කිරීම, මතුපිට ජලය නිසි ලෙස ගලායාම සහතික කිරීම, සුළිසුලං සහ ගංවතුර ආදී කාලගුණික සිදුවීම් වල බලපෑම අවම කිරීම සහ ප්‍රාදේශීය මට්ටමේ දේශගුණ තත්ත්වය දියුණු කිරීමද මෙමගින් සිදුවේ.

මිනිස් ගහණය සහ ඔවුන්ගේ අපේක්ෂාවන් ඉහළයාමත් සමගම ස්වාභාවික සම්පත් ඇති ඉල්ලුමද ඉහළ යයි. ඉදිරි වසර කිහිපය තුලදී දේශගුණ විපර්යාස ස්වාභාවික සම්පත් වලට අමතර පීඩනයක් ගෙන එනු ඇති අතර එමගින් අපට ලැබෙන පාරිසරික ප්‍රතිලාභයන් අඩාල වනු ඇත. මෙය රටෙහි ආහාර සුරක්ෂිතබවට, ජීවනෝපාය මාර්ගවලට, පෝෂණයට, මහජන සෞඛ්‍යයට සහ සමස්ථ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියටම එකසේ බලපානු ඇත.

දේශගුණ විපර්යාස වලට අනුවර්තනය වීම සඳහා ශ්‍රී ලංකාවේ ධාරිතාවය ශක්තිමත් කිරීම.

දේශගුණ විපර්යාස වලට අනුවර්තනය වීම සඳහා වූ ජාතික ක්‍රමෝපායයන්:

උපාය මාර්ග **#5**

අපගේ ඉහළ මට්ටමක ඇති ජෛව විවිධත්වය නිසිලෙස සංරක්ෂණය කිරීම සහ පාරිසරික පද්ධති නිසියාකාරව නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම, දේශගුණ විපර්යාස වලට අනුවර්තනය වීම සඳහා පහසුවෙන් සිදුකල හැකි ප්‍රායෝගික ක්‍රමෝපායන් වේ.

## දේශගුණික විපර්යාසවල බලපෑම්

දේශගුණ විපර්යාස මගින් ජෛව විවිධත්වයට සහ පාරිසරික සම්පත් වලට ඇතිකරන බලපෑම පිළිබඳ අපට තවම නිශ්චිත අවබෝධයක් නොමැත. කෙසේවුවද, දේශගුණ විපර්යාස සැලකිය යුතු මට්ටමක දීර්ඝකාලීන බලපෑම් ඇති කරනු බවට අපි විශ්වාස කරන්නෙමු. පරිසර පද්ධතීන්ගෙන් අපට වන සේවාවට මෙම බලපෑම් සෘජුවම එල්ල වෙනු ඇත.



ඡායාරූපය - සංජීව් ද සිල්වා

අපේක්ෂිත දේශගුණ විපර්යාසවල බලපෑම් පහත සඳහන් අයුරින් වේ.

- වර්ෂාපතන රටාවේ සහ උෂ්ණත්වයේ සිදුවන වෙනස සියළු පරිසර පද්ධතීන්ගේ වෙනස් කම් වලට හේතු වනු ඇත. වනාන්තරවල සිට තෙත්බිම් දක්වාද එතැන් සිට වෙරළබඩ ප්‍රදේශවලටද, ඒවායේ ජීවත්වන ශාක සහ සත්ව විශේෂවලටද මෙම වෙනස්කම් තදින් බලපානු ඇත.
- ශාක සහ සතුන් ගේ වර්ධන වේගය, උපත් වේගය සහ ව්‍යාප්තිය වැඩිවී අප බලාපොරොත්තු නොවන ආකාරයේ ප්‍රතිඵල ඇතිවිය හැක. ඇතැම් ප්‍රතිඵල හානිදායක නොවිය හැකි අතර අනෙකුත් ඒවා හානිකර විය හැක. (උදාහරණ වන්නේ ආක්‍රමණශිලී ශාක සහ සත්ව විශේෂ වේගයෙන් පැතිරීමයි.)
- මුහුදු ජල මට්ටම ඉහළ යාම සහ සාගර ජලයේ උෂ්ණත්වය ඉහලයාම නිසා කොරල්පර ආශ්‍රිතව වෙසෙන ජීවීන්ට සහ අනෙකුත් සාගර ජීවීන්ටද තර්ජන එල්ලවිය හැක.

මෙයින් පැහැදිලිවන කරුණක් වන්නේ හානියට පත්නොවූ පරිසර පද්ධති සහ ජාන විවිධත්වයක් සහිත ජීව විශේෂ දේශගුණික බලපෑම් වලට ඔරොත්තුදීමේ ශක්තියක් සහිත බවයි. එමනිසාම අනුවර්තනය සඳහා වඩාත් යෝග්‍ය ප්‍රතිචාරය වන්නේ පරිසර පද්ධති සහ ජීවී විශේෂ වලට මිනිසා විසින් ඇතිකරනු ලබන හානිය අවම කිරීමයි. එමඟින් පරිසර පද්ධති සතුව පවතින ස්වාභාවික අනුවර්තනය වීමේ හැකියාව තවදුරටත් වර්ධනය වනු ඇත.

ඡායාරූපය - සංජීව් ද සිල්වා



### ජෛව විවිධත්වය විනාශය අභිමුඛයේද?

ස්වාභාවික සම්පත් සංරක්ෂණය යනු ඒවා මුළුමනින්ම භාවිතයට නොගෙන සිටීම නොවන අතර ඒවා වඩාත් තිරසාර ලෙස භාවිතා කිරීම වේ. සම්පූර්ණයෙන් ස්වාභාවික සම්පත් නැතිකර දමනවාට වඩා එය අපහසු කාර්යකි.

ස්වාභාවික සම්පත් සංරක්ෂණය හා නැණවත් ලෙස කළමනාකරණය සඳහා විවිධ උවමනා එපාකම් සහ සාධක අතර තරගකාරීත්වයද බෙහෙවින් බලපා ඇත. උදාහරණ ලෙස පහත සඳහන් දෑ දැක්විය හැකිය. දැව හෝ ඉඩම් සඳහා අවිධිමත් ලෙස වනාන්තර එළි කිරීම, විශාල වනාන්තර එකිනෙකට සම්බන්ධ නොවූ කුඩා වනාන්තර කැබලි බවට පත්වීම, අතපසුවීමකින් හෝ උවමනාවෙන්ම කැලෑ සහ තෘණභූමි වලට ගිනිතැබීම, දැව සඳහා ගස් වැඩි වශයෙන් කැපීම සහ අනෙකුත් පරිසර සම්පත් අසීමිතව පරිහරණය කිරීම තුලින් ඇතැම් ශාක සහ සතුන් තර්ජනයට ලක් කිරීම සහ වඳ වී යාමට සැලැස්වීම. තෙත්බිම් ගොඩකිරීම, ගෙවතු ප්‍රමාණයෙන් කුඩා වී යාම, හුණු සඳහා කොරල් පද්ධති විනාශ කිරීම, ඉස්සන් වගා ව්‍යාපෘති සඳහා කඩොලාන පරිසර පද්ධති යොදාගැනීම, කළපු සහ ගංගා මෝය අවට රොන්මඩ සහ අපද්‍රව්‍ය තැන්පත් වීම නිසා කුඩා වී යාම සහ වඩා වැඩි අස්වැන්නක් ලබාගැනීමේ අරමුණින් හඳුන්වා දුන් නව බෝග ප්‍රභේද නිසා සාම්ප්‍රදායික බෝග හානියට පත්වීම ආදියද දැක්විය හැකිය. ජෛව විවිධත්වය සහ ජෛව වාසස්ථාන ආරක්ෂා කිරීම ශ්‍රී ලංකාවේ විවිධ නීති සහ රෙගුලාසි රාශියක් තිබුනද ඒවා ක්‍රියාත්මක වීම ඉතාමත් අවම මට්ටමක පවතියි. දේශගුණික විපර්යාසවල බලපෑම නිසා තත්ත්වය බැරෑරුම් වීමට පෙර, දැනටමත් පවතින පරිසර සංරක්ෂණ ගැටළුවලට අප විසින් දීර්ඝකාලීන විසඳුම් ලබාදිය යුතුව ඇත. මේ සඳහා අපට ඉතිරිව ඇත්තේ තව වසර කිහිපයක් පමණක් බව මතකයට ගත යුතුයි.

# තේමා

දේශගුණ විපර්යාස වලට අනුවර්තනය වීම සඳහා වූ ක්‍රමෝපායයන් සැකසීමේදී විවිධ පාර්ශවකරුවන්ගෙන් තොරතුරු විමසන ලදී. මෙහිදී ජලය, භූමිය සහ ජෛව විවිධත්වයට අදාලව ප්‍රමුඛත්වය ලබා දිය යුතු ගැටළු සහ ප්‍රතිචාර හඳුනාගත් අතර ඒවා පහත දක්වා ඇති මූලික තේමාවන් යටතේ වර්ග කරන ලදී.



ඡායාරූපය - සංජීව් ද සිල්වා

## පරිසර පද්ධතිවල සහ මානව පැවැත්ම සඳහා ගුණාත්මක ජලය අවශ්‍ය තරම් ඇති බවට සහතික වීම.

දැනට ශ්‍රී ලංකාවේ ජල සම්පත බහුල වශයෙන් පවතී. එහෙත් දේශගුණික විපර්යාසවල බලපෑම නිසා ප්‍රයෝජනයට ගත හැකි ජලයේ ගුණාත්මක සහ ප්‍රමාණවත් බවට බලපෑමක් ඇතිවිය හැක. දැනට අප රට තුල ජල භාවිතය සඳහා පැහැදිලි ප්‍රතිපත්තියක් නොමැත. තවද, බොහෝ ආයතන සංඛ්‍යාවක් විවිධ මට්ටම් වලදී ජලය භාවිතයට ගනු ලබන අතර, පරිශීලනය කරන අය සම්බන්ධීකරණය සඳහා බලයලත් මධ්‍යම ආයතනයක් නොමැත. ගෘහස්ථ, කෘෂිකාර්මික සහ කර්මාන්ත අංශ වඩාත් හොඳින් සම්බන්ධීකරණය කිරීම සඳහා ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණ ප්‍රවේශයක් උපයෝගී කරගත යුතුව ඇත.

## දේශගුණික විපර්‍යාසවල බලපෑමට මුහුණ දීමේ හැකියාව භෞමික පරිසර පද්ධතිතුල නංවාලීම

මිනිස් ගහණය සහ ආර්ථික කටයුතු නිසා ශ්‍රී ලංකාවේ ඉඩම් පාදක පරිසර පද්ධති දැඩි පීඩනයකට පත්ව ඇත. දේශගුණ විපර්යාස නිසා එය තවදුරටත් බැරෑරුම් වනු ඇත. හානියටපත් ජෛව වාසස්ථාන තත්ත්වයන් දේශගුණ විපර්යාස සමඟ බද්ධ වීම නිසා ස්වාභාවික පරිසර පද්ධතියේ පැවැත්මට තර්ජන ඇතිකරන ආක්‍රමණශීලී ශාක සහ සතුන්ගේ ව්‍යාප්තිය වර්ධනය වනු ඇත. එසේ හෙයින්, පරිසර පද්ධතිවල තිරසාර පැවැත්ම සහතික කරනු පිණිස, සංරක්ෂණ ක්‍රියාමාර්ග වැඩි දියුණු කල යුතුය.

## වෙරළබඩ හා සමුද්‍රික පරිසර පද්ධති වල සහ ඒ ආශ්‍රිත ජෛව විශේෂ වල ධාරණ ශක්තිය නංවාලීම

ශ්‍රී ලංකාවේ ජනගහනය වෙරළබඩ කලාපයට වැඩිපුර ගොනු වී ඇත. එම නිසාම, වෙරළබඩ කලාපය තුල ආර්ථික ක්‍රියාකාරකම් මෙන්ම පාරිසරික හානිද වැඩි වශයෙන් පෙන්නුම් කරයි. එල් නිනෝ සංසිද්ධිය, නියඟය සහ 2004 සුනාමි ආපදා මඟින් මෙම කලාපයට දැඩි හානි සිදුව ඇත. නුදුරේදීම දේශගුණ විපර්යාස නිසා ඇති වන මුහුදු ජල මට්ටම ඉහළ යාම සහ කුණාටු රළවල ඉහළයාමේ ආපදාවන්ද මෙයට එකතු වනු ඇත. වෙරළ කලාපීය කළමනාකරණ සැලසුම මඟින් වෙරළ බඩ සම්පත් ඒකාබද්ධව කළමනාකරණය කරන ආකාරය පෙන්වා දී ඇත. එහෙත් මෙය නිවැරදිව ක්‍රියාත්මක කිරීම සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ධාරිතාවය ශක්තිමත් කිරීම අවශ්‍ය වෙයි.

## අභ්‍යන්තර තෙත්බිම් සහ ඒ ආශ්‍රිත ජෛව විශේෂ වල දේශගුණික විපර්යාස වලට මුහුණ දීමේ හැකියාව නංවාලීම

ඉතා සීඝ්‍රයෙන් සිදුවන නාගරීකරණය නිසා, වගුරුබිම් සහ තෙත්බිම් වසාගෙන නගර ව්‍යාප්ත වෙමින් පවතී. බොහෝවිට මේවා පිරවූ ඉඩම් හෝ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන බවට පත්කර ඇත. මේ තත්ත්වය නිසා ලැබෙන වර්ෂා ජලය රඳවා ගැනීමට ඇති හැකියාව අවම වී තිබේ. එය ජල ජීවීන්ගේ විවිධත්වයටද අහිතකර ලෙස බලපා ඇත. දේශගුණික විපර්යාසවල බලපෑම නිසා ඇති විය හැකි ආන්තික වර්ෂාපතන තත්ත්වයන්හි බලපෑම යම්තාක් දුරකට හෝ අවම කර ගැනීම සඳහා අප ඉතා ඉක්මනින්ම තෙත්බිම් නැවත යථා තත්ත්වයට පත් කල යුතුවේ.

## දේශගුණ විපර්යාස නිසා ජෛව විවිධත්වයට ඇතිවන බලපෑම් තුලින් මතුවන සමාජ ආර්ථික ගැටළු සොයාබැලීම

අප සමාජයේ බහුතර ජනතාව තමන්ගේ දෛනික ආදායම් මාර්ග සපයාගන්නේ ස්වාභාවික සම්පත් සහ ජෛව විවිධත්වය ඇසුරෙන් කෙරෙන ගොවිතැන්, ධීවර, සහ අනෙකුත් රැකියාවල නියුතු වීමෙනි. මේ නිසාම, දේශගුණ විපර්යාස ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග වලට බලවත් ලෙස තර්ජන එල්ල කරනු ඇති අතර, ඔවුන්ගේ ආදායම් තත්ත්වයද පහල දමනු ඇත. මොවුන් අතුරින්ද වඩාත්ම අසීරුතාවයට පත්වනු ඇත්තේ මෙවැනි කම්පන දරාගැනීමේ ශක්තියක් නොමැති සමාජයේ සිටින දුප්පත්ම ජනතාවය. එමනිසා, අප දැන් සිටම එසේ අවදානමට ලක්වන ප්‍රජාව හඳුනාගත යුතු අතර, ඔවුන් සමඟ එකට එක් වී දේශගුණ විපර්යාස වලට හැඩගැසීමට සහ මුහුණදීමට අවශ්‍ය දැනුම, තාක්ෂණය සහ කුසලතාවය ලබාදිය යුතුවේ.

## ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති සංරක්ෂණය සඳහා පාර්ශවකරුවන් සජීවීකරණය සහ දැනුවත් කිරීම

සාම්ප්‍රදායිකව, ශ්‍රී ලාංකික සංස්කෘතිය හා ජීවන රටාව සොබාදහමට සමීපව පැවතින. එහෙත් අද, බොහෝදෙනා තුල සොබාසම්පත් සහ ස්වාභාවික ක්‍රියාවලින් පිළිබඳ දැනුමක් නොමැති අතර ඒ සඳහා ඔවුනගේ සංවේදීභාවයද අඩු වී ඇත. අප බොහෝ දෙනෙක් පරිසර පද්ධති වලින් ලැබෙන සේවය පිළිබඳ එතරම් තැකීමක් නොකරන අතර, කොතෙක් දුරට අප පරිසරය මත යැපෙන්නේද යන්න පැහැදිලිව හඳුනාගෙන නැත. දේශගුණික විපර්යාස සඳහා හැඩගැසීමේදී සැලකිය යුතු මූලිකාංග වන්නේ, පරිසර පද්ධති සහ සොබා සම්පත් වලට අදාළව ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීම සහ ඔවුන් විසින් පවත්වාගෙන යන ජීවන රටාව කොතරම් දුරට පරිසර පද්ධති සහ සොබා සම්පත් වලට බද්ධ වන්නේද යන්න පෙන්වා දීම වේ. ශිෂ්‍යයින් සහ පර්යේෂකයින් දේශගුණ විපර්යාස පිළිබඳ අධ්‍යයන කටයුතු සඳහා උනන්දු කල යුතු අතර මෙම අභියෝගය ඔවුන්ගේ එදිනෙදා කටයුතු වලට සමීප කර ගැනීමටද උනන්දු කල යුතුය.



ඡායාරූපය - සංජීව් ද සිල්වා

**ශ්‍රී ලංකාවේ වෙසෙන මිලියන 20ක් පමණ වන ජනගහනය ඔවුන්ගේ යහ පැවැත්ම සඳහා, මෙරට ඇති ඉතා අතිශය පොහොසත් ජෛව විවිධත්වය සහ පාරිසරික පද්ධති භාවිතා කරන අතර ඒවායෙන් ලැබෙන ස්වාභාවික සේවාවල ප්‍රතිලාභද අත් විඳියි. දේශගුණ විපර්යාස, ශාක, සතුන් සහ පරිසර පද්ධති වලට ඉතා අහිතකර බලපෑම් සිදුකරනු ඇත. ඒවා ආහාර සුරක්ෂිතභාවයට, ජීවනෝපාය මාර්ගවලට, පෝෂණයට, සෞඛ්‍යයට සහ සමස්ථ සංවර්ධනයටම බලපෑම් ඇති කරනු ඇත. ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාසයන්හි බලපෑමට හැඩගැසීම අනිවාර්ය සාධකයක් වී ඇත.**

**දැනට අවිනිශ්චිත දේශගුණ විපර්යාස සමග ජීවත් වීම හැරෙන්නට වෙනත් විකල්පයක් නොපෙනේ. එම නිසා ශ්‍රී ලංකාවද දේශගුණ විපර්යාස වල බලපෑම්වලට අනුව හැඩගැසීම අනිවාර්යයෙන්ම සිදුකල යුතුවේ. එමඟින් අප රටෙහි ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය බාධාවකින් තොරව අඛණ්ඩව සිදුකරගෙන යාමට අවස්ථාව සැලසෙනු ඇත. එවිට දුප්පත්කම අවම කිරීම, ආහාර හා ජල සුරක්ෂිත බව සහ මහජන සෞඛ්‍ය නංවාලීම සඳහා සිදුකරන ආයෝජනයන් ආරක්‍ෂා කරගතහැකි වේ.**

මෙම පත්‍රිකාව ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහය සහ තාක්‍ෂණික සහය වෙනුවෙන් වු ADB TA 7326 SRI:
***දේශගුණ විපර්යාස වලට මුහුණදීම සඳහා ශ්‍රී ලංකාවේ ධාරිතාවය නංවාලීමේ ව්‍යාපෘතිය මඟින් සකස් කරන ලදී.***

ආසියානු සංවර්ධන බැංකුව පාරිසරික අමාත්‍යංශය සමග ක්‍රියාත්මක කල මෙම ව්‍යාපෘතිය තිරසාර ආර්ථික සංවර්ධනය අඛණ්ඩව සිදුකරගෙන යන අතරතුරම දේශගුණික විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික ක්‍රමෝපාය සම්පාදනය කරන ලදී. එය අනුමත වූ විට ඵලදායී පරිසර කළමණාකරණයක් සහ වඩා විධිමත් ලෙස සංවිධානය කරගත් පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයද ඒකරාශී කරගනිමින් දේශගුණික විපර්යාස සඳහා අනුවර්තනය ලගා කරගත හැකිවේ.

**වැඩි විස්තර සඳහා සම්බන්ධ විය යුත්තේ**
දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය, පරිසර අමාත්‍යංශය,
පලමු මහල, 980/4A  වික්‍රමසිංහ පෙදෙස, ඇතුල් කෝට්ටේ, ශ්‍රී ලංකාව.
දුරකථන: +94 11 2883 481 සහ  +94 11 2883 368
වෙබ් අඩවිය: http://www.climatechange.lk/adaptation/